**රුහුණ විශ්ව විද්‍යාලය - 2018**

**-------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

රුහුණ විශ්ව විද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රුහුණ විශ්ව විද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, රුහුණ විශ්ව විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්ව විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා රුහුණ විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

රුහුණ විශ්ව විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රුහුණ විශ්ව විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ රුහුණ විශ්ව විද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ රුහුණ විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්ව විද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 99 වන ඡේදයට අනුකූල නොවන පරිදි විශ්ව විද්‍යාලයේ දේපළ කුලියට දීමෙන් ලද රු.4,033,060 ක කුලී ආදායම, ආදායම් හා වියදම් ගිණුමට ගැලපීමෙන් තොරව අරමුදල් ගිණුමකට බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ගිණුමේ රු.11,229,993 ක ශේෂයක් පැවතුණි. | 2009/01 අභ්‍යන්තර චක්‍රලේඛය පදනම් කරගෙන පිළියෙල කරන ලද මාර්ගෝපදේශනයන් 304 වන සහ 314 වන පාලක සභාවේ ලද අනුමැතියෙන් පසු එකී අරමුදල පිහිටුවා ඇති බවත්, ඉන් පසු ලද ආදායම් හා වියදම් එම අරමුදල් ගිණුම යටතේ ගිණුම් ගත කළ බවත් දන්වා සිටිමි. | වර්ෂයට අදාළ සියළුම ආදායම් හා වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 26 ඡේදය ප්‍රකාරව කටයුතු නොකර විශ්ව විද්‍යාලයට සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද ගැණුම් වටිනාකම රු.2,154,806 ක්වූ වත්කමෙහි ශුද්ධ අගය ශුන්‍ය අගයක් වන පරිදි මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 23 වගන්තිය අනුව යම් දේපළ, පිරියත හා උපකරණයක් හුවමාරු නොවන ගනුදෙනුවකින් (Non Exchange Transaction) අත්පත් කරගනු ලබන විට, එහි පිරිවැය ලෙස අත්පත් කරගන්නා දිනට සාධාරණ වටිනාකම හඳුනාගත යුතුය. එහෙත් විගණනය විසින් දක්වා ඇති ව්‍යාපෘතියන්හි අරමුණු සඳහා විශ්වවිද්‍යාල වෙත අදාළ මූල්‍ය ප්‍රධානයන් සිදුකර ඇති අතර, වත්කම් මිළට ගැනීම රුහුණ විශ්වවිද්‍යාලය මගින් සිදුකර ඇත. රුහුණ විශ්වවිද්‍යාලය මගින් ඉහත ව්‍යාපෘතියන් | මෙම ව්‍යාපෘති විශ්ව විද්‍යාලය විසින් ක්‍රියාත්මක කර ඒ සඳහා වත්කම් විශ්ව විද්‍යාලය විසින් මිලදී ගැනීම සිදුකලත් එම වත්කම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කරනුයේ ව්‍යාපෘතිය අවසානයේ විශ්ව විද්‍යාලය නමින් පැවරීම සිදුකරන අවස්ථාවේ දීය. එබැවින් එදිනට ශුද්ධ අගය ශුන්‍ය වූ වත්කම් තවදුරටත් භාවිතයට ගතහැකි |

| | | | |
|---|---|---|---|
| | | මගින් මිලට ගන්නා ලද සියළු වත්කම් හි පිරිවැයන් ඇතුලු විස්තර විශ්ව විද්‍යාලය සතු බැවින් මෙම ව්‍යාපෘති මගින් මිලට ගන්නා ලද වත්කම් හුවමාරු නොවන ගණුදෙනුවක් මඟින් ලද පරිත්‍යාගයන්ට යටත් නොවන බව | තත්ත්වයෙන් පවතින බැවින් එම වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව කටයුතු නොකර පිරිවැය රු.954,572,294 ක් වු වත්කම් විෂයයන් 11 ක සුන්බුන් වටිනාකම මූල්‍ය ප්‍රකාශයේ දක්වා තිබුණි. | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 649 හි උපදෙස් හා ගිණුම්කරණ පරිචය අනුව වත්කම්හි ප්‍රයෝජනවත් ජීව කාලය සැලකිල්ලට ගෙන ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 වගන්තිය අනුව පූර්ව ඇස්තමේන්තු වෙනස් වීම ගැලපීම විගණනය විසින් දක්වා ඇති පරිදි පිරිවැය ශුන්‍ය වු වත්කම්හි පිරිවැයට පමණක් නොව සමස්ථ වත්කම් පන්තියටම ( ENTIRE CLASS ASSETS) අදාල වන්නේ නම් පමණක් අදාල කරගත යුතුබව | මෙම වත්කම් පන්තීන්හි ඇති බොහොමයක් වත්කම්හි ශුද්ධ අගය ශුන්‍ය වන අතර, අනෙකුත් වත්කම් වලද ශුද්ධ අගය ශුන්‍ය වීමට ආසන්න බැවින් සියළුම වත්කම්වල අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීව කාලය අතර විශාල පරතරයක් ඇති බැවින් ප්‍රමිත අංක 07 හි 65 පරිදි කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරිම නිසා ඉදිකිරීම් වැඩ හා සැපයීම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයකළ රු 10,044,379. ක ප්‍රමාද ගාස්තු ආදායම් වියදම් ගිණුමට බැර නොකර ශේෂ පත්‍රයේ බැරකමක් ලෙස දක්වා තිබුණි . සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ගිණුමෙහි රු 62,486,253. ක ශේෂයක් පැවතුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව යම් කාලච්ඡේදයක මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරිම සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන අතර ආදායම් වියදම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ජනිත වූ ආදායම් එනම් පුනරාවර්ථන ස්වරූපයේ ආදායම් , ආදායම් වියදම් ගිණුමට බැර කළ යුතුය. ඒ අනුව විගණනය විසින් දක්වා ඇති ඉදිකිරීම් වැය හා ප්‍රාග්ධන සැපයීම් සම්බන්ධ ප්‍රමාද ගාස්තු මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනිත වූ ආදායමක් නොවන බැවින් ආදායම් ප්‍රකාශයට බැර කිරීමෙ අවශ්‍යතාවයක් පැන නොනඟී. තවද ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අයකර ගන්නා ලද ගාස්තු සාධාරණ හේතු ඉදිරිපත් කිරීමෙන් පසු නැවත ආපසු අදාල පාර්ශවයට ගෙවීමට බැදියාවක් පවතින හෙයින් බැරකරමක් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වා ඇත. | මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වලින් ජනනය වු ආදායම් වුවත්, විශ්ව විද්‍යාලයේ සියලුම ප්‍රාග්ධන වියදම් මෙහෙයුම් කටයුතු සඳහා අදාළ කරගනු ලබන ප්‍රාග්ධන ක්‍රියාකාරකම් ය. එබැවින් මෙම වියදම් තුළින් ජනනය වු අදායම් වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගතයුතුය. දෙපාර්ශවයක් විසින් ගිවිසුමකට එළඹෙනුයේ එක් පාර්ශවයක් විසින් ගිවිසුමක වගන්තියක් උල්ලංඝනය කළ හොත් අගතියට පත් පාර්ශවයට සහනයක් ලබා ගැනීම සඳහාය. ඒ අනුව අය කරන ගාස්තුවක් නැවත නිදහස් කිරීමට බැදියාවක් නොපවතින බැවින් එය ආදායමක් ලෙස හඳුනාගත යුතුය. |
| (ආ) | වෛද්‍ය පීඨයේ විදේශීය සිසුන්ගේ පුහුණුව වෙනුවෙන් අයකරන ගාස්තු අරමුදලෙන් ( Elective Student Fund) මිලදී ගෙන තිබු, වටිනාකම රු.6,609,372 ක් වු පුහුණු උපකරණ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අතපසු වීමකින් මඟහැරී තිබු ඔබ විසින් පෙන්වා දී ඇති රු.6,609,372 ක් වු පුහුණු උපකරණ වටිනාකම 2019 MEJ 015 දරණ ජර්නල් සටහන මගින් ප්‍රාග්ධනිත කර ඇති අතර, අදාල සංශෝධනයන් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි සිදු කරනු ඇත. | යම් ගනුදෙනුවක් සිදු වූ වහාම එය ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු නොකර වාහන විකිණීමෙන් ලැබෙන මුදල් වාහන විකිණීමේ අරමුදලක් පිහිටුවා එයට බැර කර තිබුණි . සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි රු.4,787,065 ක ශේෂයක් පැවතුණි. | භාණ්ඩාගාරයෙන් වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් ලෙස නොලැබීම හේතුවෙන් ඉහත මුදල් ආපසු නොගෙවා රදවාගෙන ඇති අතර , ඉදිරියේදි වාහන විකිණීමෙන් ලද ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. | විශේෂ චක්‍ර ලේඛයක් මගින් කරනු ලැබ ඇති නියෝගයක් බැවින් එයට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අස්පෘශ්‍ය වත්කම්හි ක්ෂය ප්‍රමාණය රු. 2,578,592 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු. 2,151,806 ක් ලෙස රු. 426,786 ක් අඩුවෙන් දක්වා තිබුණි . | විගණනයේ නිරීක්ෂණය සමඟ එකඟ වේ. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ නිවැරදි කිරීම් කරනු ඇත. | වර්ෂයට අදාළව ක්ෂය නිවැරදිව ගැලපීම් කළයුතුය. |
| (ඉ) | විශ්ව විද්‍යාලයට භාණ්ඩාගාරය මගින් ලබාදෙන ප්‍රතිපාදන මත ජනනය වූ අරමුදල් ස්ථාවර තැන්පතු ගිණුම්වල ආයෝජනය කර තිබුණු අතර ,ඒ සඳහා ලද රු 26,392,852 ක් වූ වාර්ෂික පොළි ආදායම වාර්ෂික අදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා නොගෙන එක් එක් අරමුදල් ගිණුම්වලට බැර කර තිබුණි . සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ගිණුම්වල ශේෂ එකතුව රු.36,876,083 ක් වී තිබුණි. | විශ්වවිද්‍යාලයට භාණ්ඩාගාරය මගින් ලබාදෙන ප්‍රතිපාදන මත ජනනය වූ අරමුදල් **ස්ථාවර තැන්පතු ගිණුම්** හී ආයෝජනය කර පොළී අදායම් උපයා ඇති බව විගණනය දක්වා තිබුණද ,University Integrated Fund අරමුදලේ **මූලික පොළී ආදායම්** ස්ථාවර තැන්පතු ආයෝජනයන් මගින් උද්පාදිත පොළී ආදායම් නොවන බව විගණනයේ අවධානයට යොමු කරමි.<br>**ස්ථාවර තැන්පතු සඳහා යොදා ඇති** අරමුදල් ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම මත අයකරගත් මුදල් විදේශීය උපාධි අපේක්ෂකයින්ගෙන් අයකර ගන්නා මුදල් බාහිරව සපයන සේවා මගින් උපයන අයමුදල් වලින් රැස්කරගෙන ඇති බව විගණනයේ අවධානයට යොමු කරමි. | Integrated Fund අරමුදල, ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම නිසා අයකරගත් මුදල් හා විදේශීය උපාධි අපේක්ෂකයින්ගෙන් අයකර ගන්නා අරමුදල් ඒකාබද්ධ අරමුදලේ කොටස් වන බැවින් මෙම අරමුදල් වලින් උපයන ආදායම්, ආදායම් ප්‍රකාශයට ආදායමක් ලෙස හඳුනාගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළව මහජන බැංකු තීරු ගිණුමේ පැවති රු.83,950 ක ලැබිය යුතු ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ශේෂය ඉදිරියේදි නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත | කඩිනමින් එම ශේෂ නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015,2016 හා 2017 වර්ෂවල හඳුනාගත් රු. 4,566,031 ක ණය හිමි ශේෂයන් සමාලෝචිත වර්ෂ අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ණයහිමි ශේෂය සම්බන්ධව සැපයුම් අංශ දැනුවත් කර ඇත. අදාළ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ඇත. | දීර්ඝ කාලීනව පවතින ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | වගකීම් යටතේ දක්වා තිබූ රු.9,758,750 ක් වූ නොගෙවූ ශිෂ්‍යාධාර ශේෂය තුළ 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නොගෙවූ රු.9,535,050 ක් වටිනා ශිෂ්‍යාධාර ශේෂයක් පැවතුණි. සමාලෝචිත වර්ෂය වන විට මෙම ශිෂ්‍යාධාර ශේෂයන් සම්බන්ධව හිමිකම්පෑම් නොමැති බැවින් ඒවා ප්‍රතිපාදන සැලසූ ආයතනය සමග සම්බන්ධ වී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල නොගෙවූ ශිෂ්‍යාධාර ශේෂයේ වූ මුදල් වෙනම ගිණුමක පවත්වාගෙන නොමැති අතර ඉකුත් වර්ෂයන්හි ප්‍රමාණවත් ලෙස පුනරාවර්තන අරමුදල් නොලැබීම හේතුවෙන් එම මුදල් පුනරාවර්තන ගෙවීම් සඳහා උපයෝජනය වී ඇත. ප්‍රමාණවත් අරමුදල් රැස් වූ පසු අදාල මුදල ප්‍රතිපාදන සැලසූ ආයතනයට නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | මෙම ප්‍රතිපාදන වෙනම ක්‍රියාකාරකමක් වෙනුවෙන් ලබාදෙන ප්‍රතිපාදනයක් වන බැවින් එය වෙනම ක්‍රියාවක් වෙනුවෙන් උපයෝජනය කිරීම සිදුකළ නොහැක. අදාළ කාර්ය සඳහා උපයෝජනය නොවේ නම් එය අදාළ ප්‍රතිපාදන සැලසූ ආයතනය වෙත යැවිය යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.564,029 ක් වූ පුස්තකාල පොත් අත්තිකාරම් (විදේශීය) ශේෂයෙන් රු.540,466 ක් වූ ශේෂයක පොත් ඇණවුම් කර වර්ෂ 08-12 ක කාලයක් ගතවී තිබුණත් එම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර ඇති අතර එම වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | පැවති අත්තිකාරම් ශේෂයක් අදාළ කාලය අවසාන වීමත් සමඟම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2015 මැයි 05 දිනැති අංක 04/2015 දරණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛය | රුහුණ විශ්ව විද්‍යාලයේ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා පවත්වන ලද තත්ත්ව ආරක්ෂණ කළමනාකරණ මණ්ඩල රැස්වීම්වලට ඉහළ කළමනාකරණයේ සහභාගීත්වය එක් එක් තනතුරු අනුව සියයට 19 ත් සියයට 55 ත් අතර වූ අවම , පරාසයක් ගෙන තිබුණි. | තත්ත්ව ආරක්ෂණ කළමනාකරණ කමිටු රැස්වීම් වලදී විවිධාකාර කරුණු සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරයි. මෙසේ ඉදිරිපත් කරන නිර්දේශ සනාතන සභාව හා පාලක සභාව වෙත යොමු කරනු ලබන අතර තීරණ ගැනීම සිදු කරනුයේ සනාතන සභාව හා පාලක සභාව විසින් බැවින් ගණපූරණය තීරණය ගැනීම සම්බන්ධයෙන් ගැටළුකාරී සාධකයක් නොවේ. | පාලක සභාව වෙත ඉදිරිපත් කරන නිර්දේශ වඩාත් ඵලදායී වීම සඳහා ඉහළ කළමනාකරණයේ නියෝජනය ඉතා වැදගත් බැවින් චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 අංක රහිත අතුරු ව්‍යවස්ථාවේ 5.2 වගන්තිය | 2016,2017 හා 2018 වර්ෂවල එක් එක් පීඨය විසින් පවත්වා තිබුණු තත්ත්ව ආරක්ෂණ කව රැස්වීම් වාර ගණන වර්ෂයකට 01 ත් 08 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. | පීඨවල තත්ත්ව ආරක්ෂණ කව වල සභාපති වරුන් මේ සම්බන්ධයෙන් දැනුවත් කර අතුරු ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි තත්ත්ව ආරක්ෂණ කව වලට රැස්වන ලෙස දැනුම් දීමට කටයුතු කරනු ඇත. | තත්ත්ව ආරක්ෂණ කව මසකට එක් වරක්වත් රැස්වී විශ්ව විද්‍යාලය උසස් තත්ත්වයකට ගෙන ඒමට අවශ්‍ය තීරණ ගැනීමට මැදිහත් විය යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී හඳුනා ගන්නා ලද රු.369,720 ක ටෙන්ඩර් තැන්පතු හා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ රු.26,837,282 ක රඳවා ගැනීමේ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි . | විගණනය දක්වා ඇති බොහෝමයක් ටෙන්ඩර් තැන්පතු හා රඳවා ගැනීම් ආපසු ගෙවීමේ බැදියාවක් ඇති හෙයින් ඉකුත් වූ තැන්පතු ලෙස සලකා නොමැති අතර, අදාළ තැන්පතු නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාළ අංශ ප්‍රධානින් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 381 අනුව කටයුතු නොකර 2017 වර්ෂයේ බැංකු ගිණුම් 02 ක් ආරම්භකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ගිණුම් දෙකෙහි ශේෂ එකතුව රු.5,226,403 ක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 381 ප්‍රකාරව රාජකාරී බැංකු ගිණුමක් (Official Bank Account) ආරම්භ කිරීමට භාණ්ඩාගාර අවසරය ලබා ගතයුතු බව දන්වා ඇති නමුත්, මෙම බැංකු ගිණුම් ජංගම බැංකු ගිණුම් නොවන අතර, කිසිදු චෙක්පත් ගනුදෙනුවක් සිදු නොවන බැවින්ද, භාණ්ඩාගාර අරමුදල් උපයෝජනය නොවීමක් රාජකාරි බැංකු ගිණුම් නොවීමත් හේතුවෙන් භාණ්ඩාගාරයේ අනුමැතියට යොමු කර නොමැත. | රාජ්‍ය ආයතනයක් විසින් ආරම්භ කරනු ලබන සෑම ගිණුමක්ම රාජකාරී ගිණුමක් වන බැවින් මුදල් රෙගුලාසිය අනුව භාණ්ඩාගාරයේ අවසරයක් නොමැතිව රාජකාරී බැංකු ගිණුමක් විවෘත කළ නොහැකිය. |
| (ඇ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11වන වගන්තිය හා 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 45 හි 2 වගන්තියේ ( xv ) ඡේදය අනුව මුදල් ඇමතිවරයාගේ එකඟත්වය සහිතව උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ඇමතිවරයාගේ එකඟත්වය ලබා නොගෙන කිසිදු මුදලක් ආයෝජනය නොකළ යුතු වුවද ඊට අනුකූල නොවන පරිදි විවිධ අරමුදල් ගිණුම්වල ඇති මුදල් ස්ථාවර තැන්පතුවල හා මුදල් වෙළඳ පොළ ආයෝජන අරමුදල් ලෙස ආයෝජනය කර තිබුණි . සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි ශේෂය රු. 260,362,433 ක් වී තිබුණි. | විගණනය විසින් දක්වා ඇති ආයෝජනයන් විශ්වවිද්‍යාල පනතේ 45 හි 02 වගන්තියේ II හා XV ඡේද ප්‍රකාරව පාලක සභා බලතල යටතේ හා එක් එක් අරමුදල් හි අරමුණ අනුව විවිධ අනුමැතීන්ට යටත්ව මුදල් ආයෝජනය කර ඇති අතර, මේ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇති බව කාරුණිකව දන්වමි. | මුදල් පනත අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### මූල්‍ය ප්‍රතිඵලය

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.134,979,328 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.217,329,657 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.82,350,329 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන රු.438,700,000 ක් වැඩියෙන් ලැබී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම සඳහා රජය මගින් මූල්‍ය ආධාර සහ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගත් කථිකාචාර්යවරු 04 දෙනෙකු අදාළ උපාධිය සම්පූර්ණ කර නොතිබුණි. මෙම නිලධාරින්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු මූල්‍යමය අයවීම් අයකර ගැනීමට 2019.02.11 දින පැවති 388 පාලක සභාව විසින් තීරණය කරන ලදි. ඒ බව ලිපි මගින් දන්වා ඇති අතර, එම අයකර ගැනීම් සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම සඳහා ආචාර්යවරු යොමු කිරීමේදී ගිවිසුමකට ඇතුළු වීම හා ගිවිසුම කඩ කළ හොත් ඒ අවස්ථාවේදීම අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය පීඨයේ කාර්ය මණ්ඩල නිල නිවාස 20 ක්ද ඉංජිනේරු පීඨයේ නිල නිවාස 28 ක් ද පවතින අතර, නිවාස පොරොත්තු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. ඇතැම් නිවාසවල වර්ෂ 05 ඉක්මවා වර්ෂ 01 සිට 12 ක් දක්වා කාලයක් පදිංචිව සිටියත් ගිවිසුම් අනුව කටයුතු කර නොතිබුණි. | නිල නිවාසයක් ලබා දීමේදී ඉල්ලුම්කරු අදාළ වසර 05 ම නිවාසය භාවිතා කරන්නේ යැයි යන උපකල්පනය මත නිල නිවාස සඳහා පොරොත්තු ලේඛණයක් පවත්වාගෙන යනු නොලැබේ. 2016 වර්ෂයේ සිට වසර 05 ක් සඳහා බඳු ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇත. ඒ අනුව ඉදිරියේදී අදාළ ගිවිසුම පරිදි වසර 05 සම්පූර්ණ වූ නිවැසියන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | නිල නිවාස පොරොත්තු ලේඛණයක් යාවත් කාලීනව පවත්වා ගනිමින් අනෙකුත් නිවාස අවශ්‍යතා ඇති නිලධාරීන්ට නිල නිවාස ලබා ගැනීමට හැකි වන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉන්ධන තොග භාරව ගබඩා නිලධාරියෙකු නොමැති අතර, විදුලි පරිපාලක විසින් ඉන්ධන ඇණවුමට අනුව ඉන්ධන පිරවුම් හලින් ඉන්ධන ලබාගෙන ඔහු විසින්ම භාවිතා කරනු ලබන ඉන්ධන නිකුත් කිරීමේ ලේඛනයේ සටහන් කරනු ලබයි. ඉන්ධන ලබා ගැනීම සම්බන්ධයෙන් දුර්වල පාලන ක්‍රමයක් පැවතුණි. | විදුලි ජනක යන්ත්‍රය සඳහා ඉන්ධන පිරවීම සඳහා යොදාගනු ලබන පෝරමයේ ආරක්ෂක අංශයේ නිලධාරියෙකු අත්සන් කරන හෙයින් මෙම දුර්වලතාවය අවම කරගත හැකිය. | ඉන්ධන ලබා ගැනීම හා නිකුත් කිරීම සඳහා පවතින ක්‍රමවේදය වෙනස් කර අක්‍රමිකතාවයකට ඇති ඉඩ ඇහැරිය යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විද්‍යාපීඨයේ 2015 වර්ෂයේ ආචාර්යවරයෙකු හා 2016 වර්ෂයේ ආචාර්යවරුන් දෙදෙනකු වෙත ලබා දී තිබූ රු.281,100 ක පර්යේෂණාධාර මුදල් වලට අදාළ පර්යේෂණ වාර්තාව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | මහාචාර්ය ඩබ්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය තවදුරටත් පර්යේෂණ කටයුතු කරමින් පවතින අතර, එතුමිය සප්ත වාර්ෂික නිවාඩු ලැබ අතර ආචාර්ය එන්.කේ. කළුතරගේ මහතා ව්‍යාපෘතියේ කටයුතු මෙතෙක් අවසන් කර නොමැත. මහාචාර්ය එස්.අබේසිංහ මහතා දැනට නිවාඩු ලබා ඇත. | පර්යේෂණ ආධාර ලබා දීමේදී එම නිලධාරීන්ගේ පර්යේෂණ මාතෘකා ඒවායේ කාලීන භාවය, පෙර සිදුකළ පර්යේෂණ නිම කිරීම කෙබදුද යනාදී කරුණු කෙරෙහි සැලකිලිමත් වී පර්යේෂණ ආධාර ලබාදිය යුතුය. |
| (ආ) | විවිධ සේවාවන් සැපයීම මගින් වාර්ෂිකව උපයන ලද ආදායමින් වෛද්‍ය පීඨ සංවර්ධන අරමුදල් 02 ක් හා ඉංජිනේරු පීඨ සංවර්ධන අරමුදල් 04 ක් පිහිටුවා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.131,063,381 ක අතිරික්ත ශේෂයක් පැවතුනි. එකී සංවර්ධන අරමුදල් සංවර්ධන කාර්යයන් සඳහා උපයෝජනය කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවති | අරමුදලේ නිර්ණායකයන්ට හා අයවැයන්ට යටත්ව උපයෝජනය කරන මෙන් අදාල නිලධාරින් දැනුවත් කර ඇත .මෙම පීඨ සංවර්ධන අරමුදල් භාවිතය සම්බන්ධව වන මඟපෙන්වීම් (Guideline) එම අවස්ථාව වන විට පිළියෙල කර නොතිබුණ අතර දැනට අදාල මඟපෙන්වීම් සකස්කර ඇත. | අරමුදල් පිහිට වූ අරමුණු වලට අනුව එම අරමුදල් සඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | 2007 වර්ෂයේදී නව නිපයුම් කොමිසම විසින් ලබාදී තිබුණු රෝද දෙකේ ට්‍රැක්ටරයේ අයිතිය අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකුගේ නමින් ලියාපදිංචි කර තිබුණි. | මෙම රෝද දෙකේ ට්‍රැක්ටරය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ව්‍යාපෘති වලින් ලැබෙන වත්කම් අදාළ අවස්ථාවේදී විශ්ව විද්‍යාලය නමින් පැවරීම සිදු කළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රුහුණ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් පසුගිය වර්ෂවල වෙන්කරන ලද ප්‍රතිපාදනයෙන් රු.82,000,000 ක් හෙවත් සියයට 89 ක් ව්‍යාපෘතියේ අරමුණු හා සම්බන්ධතාවයක් නොමැති ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරා තිබුණි. | අදාල ව්‍යාපෘතියේ භෞතිකව අපේක්ෂිත තත්ත්වයන් නොවූ හෙයින් පාලක සභා අනුමැතීන්ට යටත්ව ප්‍රාග්ධන වැය ශීර්ෂයන් අතර මුදල් මාරු කිරීම සිදු කර ඇත. | භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා කරනු ලබන යෝජනාවේ මෙම ව්‍යාපෘතිය මූලික අංශයක් ලෙස දක්වා ඇති බැවින් භාණ්ඩාගාරය ඒ සඳහාද වූ වියදම් පියවීමට අවශ්‍ය ප්‍රතිපාදන සමඟ සමස්ථ ප්‍රතිපාදනය ලබා දීම සිදුවේ. පාලක සභා අනුමැතිය මත මෙම ප්‍රතිපාදනය වෙනත් කාර්යයන් සඳහා යෙදවීම සිදු කළ නොහැක. |

## 3.5 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ICO 3019 දරන වෛද්‍ය පීඨ සංවර්ධන අරමුදලේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.64,731,287 ක ශේෂයක් පැවති අතර එකී අරමුදල් උපයෝජනය නොකර මහා භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන්කර ගෙන ප්‍රාග්ධන මිලදී ගැනීම් සිදුකර තිබුණි. | දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන් සලකා බලා පීඨ මණ්ඩල නිර්දේශයන් මත ඉදිරියේදී වියදම් කිරීමට බලාපොරොත්තු වන බව පෙන්වා දෙමි. | විශ්ව විද්‍යාලය විසින් පිහිටුවා ඇති අරමුදල් වල මුදල් රඳවා නොගෙන එම මුදල් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.36,461,805 ක් වූ පර්යේෂණ ආධාර ශේෂයන්ගෙන් රු.4,992,293 ක් වූ පර්යේෂණ ආධාර ශේෂයක් වර්ෂ 2 සිට වර්ෂ 5 ක් දක්වා කාලයක් ඌණ උපයෝජිතව පැවතුණි. | ඌන උපයෝජිත පර්යේෂණ ආධාර හා අරමුදල් ,අරමුදලේ නිර්ණායකයන්ට හා අයවැයන්ට යටත්ව උපයෝජනය කරන මෙන් අදාල නිලධාරින් දැනුවත් කර ඇත. | ප්‍රමුඛතාවය දිය යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ආචාර්යවරු පර්යේෂණ කිරීමට යොමු කර පර්යේෂණ ආධාර ඵලදායීව උපයෝජනයට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ත්‍යාග සහ පරිත්‍යාග ගිණුමේ රු.431,736,872 ක ශේෂ එකතුවක් පැවති අතර , එම ගිණුම් අතුරින් ගිණුම් 26ක් වර්ෂ 02සිට වර්ෂ 05 ක් දක්වා කාලයක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එම අක්‍රිය ගිණුම්වල ශේෂ එකතුව රු.26,428,622 ක් වී තිබුණි. | ඌන උපයෝජිත ත්‍යාග හා පරිත්‍යාග ගිණුමේ අරමුදල් නිර්නායකයන්ට හා අයවැයට යටත්ව උපයෝජනය කරන මෙන් අදාළ පාර්ශවය දැනුවත් කර ඇත. | ඌණ උපයෝජිතව පවතින ගිණුම්වල ශේෂ සම්බන්ධයෙන් සොයා බලා කඩිනමින් විසඳුම් සෙවීමට ක්‍රියා කළ යුතුය. |

### 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2012 අගෝස්තු 07 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2012 සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 වගන්තියට අනුකූල නොවන පරිදි වෛද්‍ය පීඨයේ ආපන ශාලාව අලුත් වැඩියාව හා ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයයන් 07 ක ප්‍රමාණ විචලනය සියයට 13 ත් සියයට 112 ත් අතර, පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. | ප්‍රධාන ඉදිකිරීමකදී ප්‍රමාණ පත්‍ර අයිතමයක් සඳහා නිශ්චිතවම අගයක් ලබා දිය හැකි වුවත් පුනරුත්තාපන වැඩ කටයුතු වලදී එලෙස නිශ්චිත ගණනයක් කිරීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් වන බැවින් දළ වශයෙන් ප්‍රමාණ පත්‍ර සැකසීම සිදු කිරීම සාමාන්‍ය පිළිවෙතයි. කෙසේ වෙතත් බිල්පත් සඳහා ගෙවීම් කරනු ලබන්නේ measure & pay ක්‍රියාපිළිවෙත අනුවය. | යම් ඉදිකිරීමක් හෝ අලුත් වැඩියාවක් සිදු කිරීමේදී ඒ පිළිබඳව හොඳ අධ්‍යනයකින් පසුව වැඩ අයිතමයන් නිෂ්චය කර ප්‍රමාණ විචලනයන් අවම වන පරිදි ප්‍රමාණ බිල්පත් සැකසීම කළ යුතුය. විචලනව වැඩිවන විට ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය දියාරු වී යනු ඇත. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (ඇ) ඡේදයට අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන විෂයන් 16 ක් සඳහා මුළු ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු.255,032,110 ක ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | විගණනය විසින් මුලු ප්‍රතිපාදිත මුදල ඉක්මවා ප්‍රාග්ධන විෂයන් 16 ක් සඳහා ප්‍රසම්පාදනය කර ඇති බව දක්වා තිබුණද , ඉහත දක්වා ඇති ප්‍රාග්ධන වැය විෂයන් 04 ක් හැරුණු කොට අනෙකුත් කිසිදු ප්‍රාග්ධන විෂයක **මුලු ඇස්තමේන්තු පිරිවැය** (Total Cost estimate) ඉක්මවා ගොස් නොමැති බව විගණනයේ අවධානයට යොමු කරමි. සමහර අවස්ථාවන් වලද මූල්‍ය ඇස්තමේන්තුව ඉක්මවා , වැඩි භෞතික ප්‍රගතියක් ඇති ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීම් කිරීමට සිදුවීම හේතුවෙන් එක් එක් ප්‍රාග්ධන ව්‍යාපෘතිවල වැය ශීර්ෂය වාර්ෂික වෙන් කිරීම ඉක්මවා යෑම හෝ ඉතිරිවීම සිදුවෙයි. තවද ප්‍රවර්තන වර්ෂයේ වැඩිපුර වියදම් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන ඊළඟ වර්ෂයේ සාමූහික ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීමේදී ආවරණය වන බවද විගණනයේ අවධානයට යොමු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදනයන් සිදුකළ යුතුය. |
| (ඇ) | මුහුදට ආසන්න පරිසර තත්ත්වයන් තුළ මිලදී ගැනිම් සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී වැඩි සැලකිල්ලක් යොමුකළ යුතු සාධක කෙරෙහි අවධානය යොමු නොකර 2017 වර්ෂයේ රු.263,074 ක් වැය කර කළමනාකරණ හා මූල්‍ය පීඨයට මිලදී ගෙන තිබුණු Standard 3 Seated Lobby Chairs 14 ක් සමාලෝචිත වර්ෂය වන විටත් ප්‍රයෝජනයට ගත නොහැකි පරිදි මළ බැඳී කැඩී ගොස් තිබුණි. | පීඨ ගොඩනැගිල්ලේ ලොබිය සෘජුවම මුහුදු සුලං වැදීම හේතුවෙන් මෙම පුටු ඉතා ඉක්මනින් මළ කෑමට ලක්ව ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී පීඨය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේදී මෙම කරුණ පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමට සටහන් කර ගතිමි. | මිලදී ගැනීම් සිදු කිරීමේදී මිල දී ගන්නේ කුමන කාර්යයන් සඳහාද ඒ සඳහා උචිතද, පරිසර තත්ත්වය කෙබඳුද යන්න පිළිබඳව සැලකිලිමත් වී මිලදී ගැනීම නිර්දේශ කළ යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉංජිනේරු පීඨයට අනුමත මහාචාර්ය තනතුරු 04 ම පුරප්පාඩු වී පැවතුණ අතර, විශ්ව විද්‍යාලයට අයත් පීඨ 09 හි කථිකාචාර්ය තනතුරු පුරප්පාඩු 154 ක් පැවතුණි. ඉන් වෛද්‍ය පීඨය, තාක්ෂණ පීඨය හා විද්‍යා පීඨයේ පුරප්පාඩු ප්‍රමාණය පිළිවෙලින් 32 ක්, 23 ක් හා 22 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | ඉංජිනේරු පීඨයේ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවා ඇතත් එම පීඨයේ මහාචාර්ය තනතුරු වලට අදාළව කිසිවකුත් අයදුම් කර නොතිබුණි. වෛද්‍ය පීඨය, තාක්ෂණ පීඨය හා විද්‍යා පීඨයේ පවතින පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, අදාළ මූලික කටයුතු සිදු වෙමින් පවතී. | තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ආයතනයේ දැක්ම කරා මානව සම්පත මෙහෙය වීමට ක්‍රියාකළ යුතුය. |

**(ආ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ මාණ්ඩලික තනතුරු 14 ක් මාණ්ඩලික නොවන තනතුරු 156 ක් සුළු සේවක තනතුරු 74 ක පුරප්පාඩු පැවතුණි. | මෙම පුරප්පාඩු තනතුරු සඳහා මේ වන විට බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. | තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ආයතනයේ දැක්ම කරා මානව සම්පත මෙහෙය වීමට ක්‍රියාකළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලසුම පිළියෙළ කිරීමේදී ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂය සඳහා අයවැය ලේඛනය, වාර්ෂික අයවැය පදනම්කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්, ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි. | 2019 – 2023 සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙළ කර ඇති අතර එහි ඇතුළත් අරමුණු ඉටු කර ගැනීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර ඇත. | චක්‍රලේඛය පරිදි ක්‍රියාකාරී සැලසුම සකස් කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිලධාරීන් 06 දෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබූ අතර, 2018 වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණන සැලසුම ආවරණය වන පරිදි නිලධාරීන්ට කාර්යය පැවරුම් ලේඛනයක් මගින් විගණන කටයුතු පැවරීමට කටයුතු කර නොතිබුණි. 2018 වර්ෂයේදී ආවරණය නොවූ විගණන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි 2019 වර්ෂයේදී විගණන සැලසුම යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන්ට කාර්ය පැවරීම සිදුකර තිබුණත් නිලධාරීන් සියලු දෙනා වෙත කාර්ය පැවරුම් සිදු කර ඇති බව කාරුණිකව දන්වමි. 2018 හා 2019 වර්ෂයේදී අභ්‍යන්තර විගණන සැලැස්ම මු.රෙ. 134 (2) පරිදි පිළියෙළ කර ඇති බව කාරුණිකව දන්වමි. | වර්ෂයේ විගණන සැලසුම ආවරණය වන පරිදි කාර්යය පැවරුම් ලේඛනයක් මගින් නිලධාරීන්ට කාර්යයන් පැවරීමට කටයුතු කළ යුතුය. |

**4.3 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ වැඩසටහන් අයවැය ලේඛනයට අනුව අළුත්වැඩියා හා ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් රු.117,000,000 ක් වෙන්කර තිබුණි. පසුගිය වර්ෂයේ ප්‍රමාණවත් පරිදි මුදල් වෙන්කර නොතිබියදී 2018 වර්ෂයේ ඒ සඳහා වෙන්කර තිබුණේ රු.75,000,000 ක ප්‍රමාණයක් හෙවත් පසුගිය වසරට වඩා රු.42,000,000 ක් අඩුවෙනි. විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 30 දින වන විටත් එහි වියදම රු.135,354,653 ක් හෙවත් ඇස්තමේන්තුව ඉක්මවා සියයට 80 ක් වී තිබුණි. ඒ අනුව තාර්කික පදනමින් ඇස්තමේන්තු සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. | 2018 වර්ෂය සඳහා භාණ්ඩාගාරය ප්‍රතිපාදන මත වැය කළ ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපන වියදම ඇස්තමේන්තුව ඉක්මවා සියයට 45 ක් වන අතර 2019 වසරේ ප්‍රාග්ධන ප්‍රදානයෙන් එම වැඩිදුර වියදම් වූ ප්‍රමාණය ආවරණය කර ගැනීමට බලාපොරොත්තු වේ. | තාර්කික පදනමක් මත ඇස්තමේන්තු සකස් කිරීම සිදු කළ යුතුය. |

**4.4 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්ව විද්‍යාලයේ කසල බැහැර කිරීම සඳහා Target Environmental Service ආයතනයට පවරා තිබූ අතර සේවා ගිවිසුම අනුව කසල බැහැර කිරීමේ දී ඒවා දිරාපත් වන සහ දිරාපත් නොවන ලෙස වර්ගීකරණය කිරීමෙන් පසු බැහැර කලයුතු බව දන්වා තිබුණි. නමුත් රුහුණු විශ්ව විද්‍යාලයේ ඉවතලන අපද්‍රව්‍ය කිසිදු වර්ගීකරණය කිරීමකින් තොරව කොටවිල කසල අංගනයට භාරදීම සිදුවන බව නිරීක්ෂණය විය. | කසල වර්ගීකරණය කර බැහැර කිරීම සිදු කරන ලෙස Target Environment Service ආයතනයට උපදෙස් දී ඇත. මේ සඳහා ප්ලාස්ටික් බඳුන් සපයා වැල්ලමඩම සංකීර්ණයේ ස්ථාන 10 ක ස්ථාන ගත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. | පරිසර හිතකාමී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම තුළින් විශ්ව විද්‍යාලය තුළ කසල කළමනාකරණ කිරීමට මැදිහත් විය යුතුය. |